# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 1557/7 - 2008 ජුලි 07 වැනි සඳුදා - 2008.07.07

(ආණ්ඩුවේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

### ආණ්ඩුවේ නිවේදන

එල්. ඩී. බී. 21/78

1978 අංක 16 දරන විශ්ව විද්‍යාල පනත

25අ වගන්තිය යටතේ වූ නියමය

1978 අංක 16 දරන විශ්ව විද්‍යාල පනතේ 25අ වගන්තිය මගින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, උසස් අධ්‍යාපන අමාත්‍ය මහාචාර්ය වටරක ආරච්චිලාගේ විශ්වා වර්ණපාල වන මා විසින්, 1992 අංක 41 දරන ජාතික සමාජ සංවර්ධන ආයතනය පනත යටතේ පිහිටුවනු ලැබූ ජාතික සමාජ සංවර්ධන ආයතනය සම්බන්ධයෙන් ඉහත කී පනතේ 70ඇ වගන්තිය ප්‍රකාර වාර්තාවක් ලබාගැනීමෙන් පසුව, මෙහි උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති උපාධි ප්‍රදානය සඳහා උසස් අධ්‍යාපනය ප්‍රවර්ධනය කිරීමේ කාර්ය සඳහා ඉහත කී ආයතනය උපාධි පිරිනමනු ලබන ආයතනයක් ලෙස මේ නියමය මගින් පිළිගනිමි.

2005 ජුනි මස 01 වන අංක 1395/15 දරන අති විශෙෂ ගැසට් පත්‍රයේ පළකරන ලද 25අ වගන්තිය යටතේ සාදන ලද නියමය මෙයින් පරිච්චින්න කරනු ලැබේ.

උපලේඛනය

1. සමාජ කටයුතු පිළිබඳ උපාධිය
2. සමාජ කටයුතු පිළිබඳ පශ්චාත් උපාධිය

මහාචාර්ය වටරක ආරච්චිලාගේ විශ්වා වර්ණපාල, (පා.ම.),
උසස් අධ්‍යාපන අමාත්‍ය.

2008 ජුලි මස 01 වැනි දින,
කොළඹ දී ය.

07 - 534


1A - G 009936- 935 (2008/07) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.